**SLBFE News**

# විදේශ සේවා කාර්යාංශ පනතට අනුව සියළු කටයුතු කිරීමට සූදානම්...

## නව සභාපති වැඩභාර ගනිමින් කියයි...



කාර්යාංශ පනතට යළි ජීවය ලබාදෙමින් එයට අනුකූලව සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තමන් සියළු දෙනාගේම සහය අපේක්ෂා කරන බව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නව සභාපති ලෙස වැඩ භාරගත් නීතීඥ නන්දපාල වික්‍රමසූරිය මහතා ප්‍රකාශ කළේය. වෘත්තියෙන් නීතීඥයෙකු වූ නන්දපාල මහතා වසර 27ක් නීතීඥ වෘත්තියේ නියැළී සිටින අතර

ඒ මහතා මීට පෙර වැඩබලන මහේස්ත්‍රාත්වරයෙකු ලෙසද කටයුතු කර තිබේ. නීතීඥ නන්දපාල වික්‍රමසූරිය මහතා කාර්යාංශයේ 14 වන සභාපතිවරයායි. වැඩිදුරටත් අදහස් දක්වූ ඔහු සඳහන් කළේ, විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් කාර්යාංශ පනතට අනුව සියලු කාර්යයන් නොපිරිහෙලා ක්‍රියාත්මක කරන බවයි. සේවක මණ්ඩලයේ අවංකභාවය හා කැපවීම, කාර්යාංශයේ ඉදිරිගමනට අත්‍යාවශ්‍ය බවද ඔහු කියා සිටියේය.

කාර්යාංශයේ පනතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් සුභසාධනය, ආරක්ෂණය හා අනෙකුත් සියළුම සේවාවන් ක්‍රියාත්මක කිරීමටද, අනවශ්‍ය වියදම් හා වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමටද, තමන් කටයුතු කරන බව ඔහු සඳහන් කළේය.

මෙම අවස්ථාවට විදේශ රැකියා අමාත්‍ය නීතීඥ තලතා අතුකෝරළ, අමාත්‍යාංශයේ ලේකම් ජී.එස්.විතානගේ, කාර්යාංශ සාමාන්‍යාධිකාරී හරිස්චන්ද්‍ර බටගොඩ යන මහත්ම මහත්මීන් ඇතුළු සේවකයින් රැසක් එක්වී සිටියහ.